# වෙළෙඳ,වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
# ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල

**(1) .** තනතුරු නාමය **:- සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) (පුරප්පාඩු - 01)**

**(2) .** සේවා ගණය **:- කළමනාකාර (MM 1-2)**

**(3) .** අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන (පහත I හෝ II හෝ III )**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය, වාණිජ්‍ය, රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය යන විෂය ක්ෂේත්‍රයකින් ලබා ගත් ප්‍රථම උපාධිය

හෝ

II. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ආවසරික/අන්තර් මධ්‍යම විභාගය සමත් වීම

හෝ

III. බ්‍රිතාන්‍යයේ වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ (CIMA) ආවසරික/අන්තර් මධ්‍යම විභාගය සමත් වීම

හෝ

IV. ලංකා කාර්මික විද්‍යාලය මඟින් පිරිනමන ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA)

සමඟ

ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) ක පළපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

II. ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ කණිෂ්ඨ කළමනාකාර (JM) සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**(4) .** වයස

අවුරුදු 22 ට නො අඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**(5) .** වැටුප් ක්‍රමය

සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය:

MM 1-2 - 2025 රු.94,170-10X2,480-15X3,450-170,720/=

**(6) .** තනතුරට පැවරෙන කාර්යයන්

- ආයතනයේ අරමුණු හා වැඩසටහන් වලට අනුකූලව ඒකාබද්ධ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීම හා කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.
- සමුපකාර විෂයභාර අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය හා වෙනත් අදාළ ආයතන සමඟ කළමනාකරණ මණ්ඩල තීරණවලට අනුකූලව අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කරමින් හා ඔහුගේ උපදෙස් මත ක්‍රියාකිරීම.
- ඒ අනුව මූල්‍ය පරිපාලනය සිදුකිරීම හා ඉටුකළ යුතු ගිණුම් හා වාර්තා ඉදිරිපත් කිරීම.
- ආයතනයේ දෛනික මූල්‍ය කළමනාකරණය හා මූල්‍ය පාලනය කිරීම.
- ආයතනයේ අනෙකුත් අරමුදල් කළමනාකරණය කිරීම හා ආයෝජනය කිරීම.
- කළමනාකරණ විගණන කමිටුවේ ලේකම් වශයෙන් අදාළ රාජකාරි ඉටුකිරීම. කළමනාකරණ මණ්ඩල තීරණ හා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන මූල්‍ය පරිපාලනයට අදාළ වෙනත් රාජකාරි ඉටු කිරීම.

**(7) .** බඳවා ගැනීමේ ක්‍රමවේදය

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ප්‍රතිඵල මත තෝරා ගනු ලැබේ.

**(8) . ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ ක්‍රමය**

| | | |
|---|---|---|
| I | අදාල පළපුරුද්ද | - ලකුණු 30 |
| II | අදාල අමතර අධ්‍යාපන සුදුසුකම් | - ලකුණු 30 |
| III | අනෙකුත් කුසලතා/ කාර්යය සාධනයන් | - ලකුණු 15 |
| IV | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | - ලකුණු 25 |
| | | **ලකුණු 100** |

අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරි (රා/ආ)
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
පොල්ගොල්ල
2026.08.09